ගම්පොළ ප්‍රදේශයේ බාලවයස්කාර දැරියක් පියාගේ සහ බාප්පාගේ පහරදීමෙන් පසුව මියගියේ යැයි පැවසෙන පුවත පසුගිය දිනවල මාධ්‍ය තුළ පුළුල් අවධානයකට ලක්ව තිබිණි. එසේම, ඒ සම්බන්ධයෙන් මියගිය දැරියගේ සොයුරිය වන බාලවයස්කාර දැරියකගෙන් සාක්ෂි ලබාගැනීමක් ද සිදුවී තිබිණි.

එහිදී, ඇතැම් මාධ්‍ය සාක්ෂිකාර බාලවයස් දැරියගේ ප්‍රකාශය සඳහන් කරමින්, ඇගේ අනන්‍යතාවයද ඡායාරූප/වීඩියෝ ඔස්සේ සහ/හෝ නම සඳහන් කිරීම ඔස්සේ අනාවරණය කර තිබිණි.

මෙම සාක්ෂිකාර දැරියගේ ප්‍රකාශය ප්‍රසිද්ධියේ ලබාගැනීම, එයට මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධිය ලබාදීම සහ ඇගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීම සමාජ මාධ්‍ය තුළද විවේචනයට ලක්ව තිබිණි.

බාලවයස්කරුවන්ට සිය පාසල් සමය අනවශ්‍ය අතපෙවීම් වලින් තොරව සම්පූර්ණ කරගන්නට නිදහස තිබිය යුතු බව මාධ්‍ය ආචාර ධර්ම පවසයි. එසේම යුනිසෙෆ් සංවිධානයේ මාර්ගෝපදේශයන්ට අනුව, බාලයන්ගෙන් කරුණු විමසීමේදී සහ එම කරුණු වාර්තා කිරීමේදී, බාලයන්ගේ පෞද්ගලිකත්වය සහ රහස්‍ය භාවය සුරැකීම වෙත මාධ්‍ය විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. එසේම, බාලයන්ව අවදානමක හෙළන ආකාරයේ කිසිදු තොරතුරක් හෝ ඡායාරූපයක් ප්‍රසිද්ධ කිරීමෙන් වළකින ලෙසද යුනිසෙෆ් මාර්ගෝපදේශයන් වැඩි දුරටත් දක්වයි.

එසේ නම්,

1) මෙම සිදුවීමේ සැකකරුවන් පවුලේ සමීපතම ඥාතීන් වන පසුබිමක, සාක්ෂිකාර දැරියගේ සාක්ෂි ප්‍රකාශය මාධ්‍ය තුළින් ඉදිරිපත් කිරීම, ඇයගේ ආරක්ෂාවට තර්ජනයක් නොවන්නේ ද?

2) මෙම සිදුවීමේ ස්වභාවයද අනුව බලන කළ, සාක්ෂිකාර දැරියගේ අනන්‍යතාවය හෙළිදරව් කිරීම ඔස්සේ, ඇගේ පාසල් ජීවිතයට බාධා නොපැමිණෙනු ඇතැයි සහතික විය හැකිද?

3) මෙම සිදුවීමේ බරපතළ කම සමාජයට හෙළිදරව් කිරීමේදී එම බාලවයස්කාර දැරියගේ සාක්ෂිය වැදගත් වන බවට විවාදයක් නොමැත. නමුත්, එම සාක්ෂිය ලබාදුන් මූලාශ්‍රය හෙළිදරව් නොකරමින් එම තොරතුරු පළ කළත්, ඉන් එම පුවතේ බරපතළ භාවය සන්නිවේදනය නොවන්නේ ද?

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://www.unicef.org/eca/media/ethical-guidelines
https://www.editorscode.org.uk/the_code.php